යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව
ගාල්ල දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 10 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම්**

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සහික දීමනාව රු.683,000 ක් වුවත් රු.453,750 ක් වූ යතුරුපැදි ණය වාරික අයකිරීම් අඩුකර රු.229,250 ක් පමණක් සහික දීමනා ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් රු.453,750 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වැය විෂයයන් 12 කට අදාල වියදම රු.16,809,982 ක් වුවද, වැය ලේඛනයෙහි දැක්වෙන වියදම් ප්‍රධාන ලෙජරයට පිටපත් කිරීමේ දී රු.16,953,446 ක් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ වියදම් රු.143,464 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී පෙර පාසල් ළමුන්ගේ නිල ඇඳුම් සඳහා හා පෙර පාසල් ළමුන්ගේ වැඩ මුළු සඳහා ගෙවා ඇති රු.118,970 ක් වූ වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ප්‍රාග්ධන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) පහලවිල පාලම ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.488,539 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 05 ක් වෙනුවෙන් ලැබිය යුතු මූලධන ආධාර රු.12,891,356 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා ණයගැතියන් රු.12,891,356 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුල වැටුප් ප්‍රතිපූර්ණය ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ රු.11,136,114 ක් සියලු වැඩසටහන් අතර විභජනය නොකර, එක් වැඩ සටහනක් යටතේ දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විදුලි උපකරණ තොගය රු.164,391 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.117,077 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා උපකරණ වියදම රු.47,314 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැයකර තිබූ රු.784,214 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) සභාව සතු වෙළෙන්දාව ඉඩමෙහි පවත්වාගන යනු ලබන ද්විපාර්ශික ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලය දැක්වීම සඳහා වෙනම ගිණුමක් ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.4 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව දැක්වෙන ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව දැක්වෙන ශේෂයන් අතර රු.1,012,710 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.97,872,904 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛනයන් සහ යාවත්කාලීන කරන ලද ණය ලේඛනය ආදි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.677,925 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.261,989 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 අක්කර බදු, වෙළඳ බලපත්‍ර සහ බදුකුලී

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගත යුතුව තිබූ රු.243,193 ක් වූ අක්කර බදු, රු.73,250 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු සහ රු.204,672 ක් වූ බදු කුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.411,210 ක උසාවි දඩ හා රු.4,026,575`ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**2.2.3 වරිපනම් බදු**

-------------

සභා බලප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශ ලෙස සැලකිය හැකි මාර්ග පද්ධති පහසුකම්, විදුලි පහසුකම්, දූරකථන පහසුකම්, ජල පහසුකම් හා කැලිකසල ඉවත් කිරීමේ පහසුකම් පවතින යක්කලමුල්ල නගරය වැනි ප්‍රදේශ තිබියදී ත් එම ප්‍රදේශ හඳුනාගෙන1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති වල විධිවිධාන ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2013 වර්ෂය සඳහා උප සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් 09 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**3.2.1 සේවක ණය**

--------------

සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා සේවයෙන් ඉවත්ව ගිය සේවකයින් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු.41,751 ක ණය ශේෂයක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**3.2.2 දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය නොගෙවීම**

-----------------------------------------------------------------------

සභාව විසින් ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සහ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් 2013 දෙසැම්බර් 31 දින දක්වා රු.10,231,092 ක් ලබාගෙන තිබුණි. 2010 තුන්වන කාර්තුවෙන් පසු වාරික හා පොලී ගෙවා නොතිබු නිසා විගණන දිනය වූ 2014 මාර්තු 20 වනවිට රු.2,043,227 ක වාරික මුදලක් ද, රු.2,870,707 ක පොලියක් ද වශයෙන් එකතුව රු.4,913,934 ක් දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතුව තිබුණි.

**3.2.3 නිරවුල් නොකල ගිණුම්**

--------------------------

වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට දිගින් දිගටම පැවත එන ගිණුම් විෂයයන් 05 කට අදාලව රු.1,225,092 ක ශේෂයක් හඳුනාගෙන පියවීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.2.4 අවිධිමත් ගනුදෙනු

-----------------------

ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරයෙකුට 2013 ජුනි මාසය වෙනුවෙන් 2013 ජුනි 21 දින සභික දීමනාව ලෙස රු.5,000 ක් ගෙවා තිබිය දී නැවත වරක් 2013 ජුනි මාසය සඳහා සභික දීමනා ලෙස රු.5,000 ක් 2013 ජුලි 19 දින සභා අරමුදලින් ගෙවා තිබුණි.

## 4. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය